ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2023 - 01 - 09 |

පැමිණිලි පාර්ශවය : ඒ.එම්.සී.එස්. සිරිවර්ධන මයා,
කහගොල්ල,
දියතලාව.

වගඋත්තරපාර්ශවය : 01. සභාපති,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර,
කැලණිය.

02. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර,
කැලණිය.

<u>පැමිණිලි අංකය : **HRC/4325/16**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිලිකරු වගඋත්තරකාර බැංකුවේ බැංකු කලමණාකරුවෙකු ලෙස බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේ සේවය කරමින් සිටියදී, බැංකුවේ උකසට තබන ලද රත් භාණ්ඩ සම්බන්ධව පසුකාලීනව බැංකුවේ නිලධාරීන් විසින් සිදු කළ විගණනයකදී ඇති වූ ඌණතාවයන් හා එකී රත් භාණ්ඩ ප්‍රමිතියෙන් තොරව තිබීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය වීම මත පැමිණිලිකරුට එරෙහිව කටයුතු කර ඇති බව පැමිණිල්ල තුළින් විස්තරාත්මකව දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් අනතුරුව එකී චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන්ට පැමිණිලිකරු වරද පිළිගැනීමෙන් අනතුරුව ඔහුට අවවාද කොට නැවත සේවයේ පිහිටුවන ලද බවත්, 2014.06.11 දින හා 2014.11.14 දිනහන්හිදී එකී පළමු චෝදනා පත්‍රය නිකුත් කිරීමෙන් පසු සේවයේ පිහිටුවීමෙන් ද අනතුරුව නැවත 2016.12.27 දින චෝදනා පත්‍රයක් දෙවන වරටද ලබාදෙමින් තවත් රත් භාණ්ඩ කොටසක් සම්බන්ධව ගැටළුවක් ඇති වූ බව දක්වා නැවත නිදහසට කරුණු විමසා එතෙක් වැඩ තහනම් කරත ලද බවද



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දක්වා ඇත. මේ අනුව එකම වරද සම්බන්ධව දෙවරක් තඩු පැවරීමෙන් නීතියේ පවතින මූලික න්‍යායන්ට පටහැනිව පැමිණිලිකරුට එරෙහිව පමණක් කටයුතු කිරීමෙන් මෙම පැමිණිලිකරුට පමණක් වෙනස්කොට සැලකීමක් සිදු කොට ඇති බවත්, තමා වෘත්තීය සමිතියක නායකයෙකු වීම මෙම වෙනස්කොට සැලකීමට තවත් එක් හේතුවක් වූ බවත්, පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය විසින් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාවේ කරුණු අනුව, මෙම රන් භාණ්ඩ සම්බන්ධ ගැටළුව හා ප්‍රමිතියෙන් තොර වීමට අදාළව මුල් වරට නිකුත් කරන ලද චෝදනා පත්‍රයෙන් අනතුරුව දෙවනවරට නිකුත් කරන ලද චෝදනා පත්‍රය මුල් චෝදනා පත්‍රයට නිකුත් කළ රන් භාණ්ඩ තොගයට අදාළ නොවන බවද දෙවන වර චෝදනා පත්‍රයක් නිකුත් කරන ලද්දේ මුල් අවස්ථාවේ ගැටළු සහගත වූ රන් භාණ්ඩ තොගයෙන් හඳුනාගත් වෙනත් තොගයකට බවද දක්වා ඇත. ඒ අනුව එකී දෙවන වර හඳුනාගත් කොටසකට මෙම දෙවන චෝදනා පත්‍රය ලබාදුන් බවද මේ සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් විසින් අභියාචනාධිකරණයේ ගොනු කළ රිට් අයදුම්පත්‍රයක් ද තිබී ඇති අතර, එය අධිකරණය විසින් සළකා බලා ප්‍රතික්ෂේප කර ඇති බවද දක්වා ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ, බණ්ඩාරවෙල බැංකු ශාඛාවේ පැවති සියළු රන් භාණ්ඩ, පැමිණිලිකරු ඉදිරියේදී බැංකුවේ විගණන අංශයේ නිලධාරීන් විසින් දිස්ත්‍රික් කළමණාකරු හා ප්‍රධාන කළමණාකරුද, සහකාර සාමාන්‍යාධිකාරී සහ ශාඛාවට පත්වූ නව කළමණාකරුද ඉදිරියේ දී පරීක්ෂා කර බලා භාරගන්නා ලද බවය. මෙයින් කොටසක රන්මය වටිනාකම අගයෙන් අඩු බවද එහි වටිනාකම කැරට් ප්‍රමාණයෙන් අඩු බවද දක්වා පැමිණිලිකරුට එරෙහිව 2014.11.18 දින හෝ ආසන්න දිනක චෝදනා පත්‍රය ලබාදී ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරු බැංකුවේ වැඩ තහනමට ලක්වී නැවත 2015.10.19 දින බැංකුවේ සේවයට වාර්තා කිරීමට ඉඩ ලබාදීමෙන් අනතුරුව වසරකට පමණ පසු නැවත ඉහත රන් භාණ්ඩ තොගයෙන් තවත් කොටසක් තත්ත්වයෙන් බාල බවද, වටිනාකම කැරට් අගය අඩු බවද පවසා නැවත පැමිණිලිකරු වැඩ තහනමට ලක් කර ඇති බවද දක්වා ඇත. පැමිණිලිකරු ඉදිරිපත් කරන කරුණු අනුව බැංකු ශාඛාවේ පැවති සියළු රන් භාණ්ඩ බැංකුවේ විගණන කණ්ඩායම් විසින් නිසි ලෙස පරීක්ෂා කර බලා රන් භාණ්ඩ එකවර භාරගෙන ඉන් එක් කොටසක වංචාවක් ඇති බවට දක්වා චෝදනා කර වසර කිහිපයකට පසු නැවත ඉන් තෝරාගත් තවත් කොටසක වංචාවක් ඇති බව දක්වා චෝදනා කර චෝදනාපත්‍රයක් නිකුත් කිරීමෙන් එක් වරක් වැඩ තහනමකට ලක්ව කිසිදු වැටුපක් හෝ දීමනාවක් නොමැතිව සේවයට පැමිණි පසු, නැවත පැමිණිලිකරු සේවය කරමින් සිටින අතරතුර නැවත වැඩ තහනමකට ලක් කිරීමෙන් බැංකුව විසින් එකම සිද්ධියකට දෙවරක් තඩු පවරා එනම්, චෝදනා කර දඬුවම් දීමෙන් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය වන බවය.

තවද පැමිණිලිකරු එකී දෙවන චෝදනාව සම්බන්ධයෙන්ද නිවැරදි භාවය ඔප්පු කළ පසු නැවත වතාවක් ඉදිරි දිනකදී ඉහත කී රත් භාණ්ඩ තොගයෙන් තවත් කොටසක කැරට් අගය අඩු බව පවසා වැඩ තහනමකට ලක් කිරීමට හෝ චෝදනා කරමින් හිංසා කිරීමට ඉඩ ඇති බවට පැමිණිලිකරු කියා සිටින කරුණු ඔහුගේ පැතිකඩින් බලා ප්‍රකාශ කර සිටීම තුළ සත්‍යතාවයක් ද සාධාරණත්වයක්ද පෙනී යයි.

**නිරීක්ෂණ නිගමනය :-**

වගඋත්තරකාර බැංකුව විසින් බැංකුව සතු රත් භාණ්ඩ විගණනය කර පරීක්ෂාවක් සිදු කර එකවර තොගයම භාරගෙන තිබී ඇතත්, පසුව කිසිදු රත් භාණ්ඩයක් පැමිණිලිකරුගේ වගකීම යටතේ නොතිබියදී, කරන ලද චෝදනාවන් පවතින බව අනාවරණය වේ. බැංකුව විසින් පැමිණිලිකරුට එරෙහිව විෂමාචාරයක් සිදු කළ බවට චෝදනා කර වැඩ තහනමට ලක් කර තිබීමෙන් මූලික අයිතිවාසිකමක් කඩකිරීමකට හේතුවන කාරණාවක් උත්පාදනය නොවුනද පැමිණිලිකරු විසින් සන්තකය භාරදෙන අවස්ථාවේ රත් භාණ්ඩ භාරගත් නිලධාරීන් විසින් පරීක්ෂා කර බලා එම අවස්ථාවේ වරදක් ඇති බවට අනාවරණය කර නොගත් කරුණු පසුව අනාවරණය කර ගනිමින් පැමිණිලිකරුට එරෙහිව චෝදනා කිරීම තුළ පැමිණිලිකරුට වෙනස්කොට සැලකීමේ සිද්ධියක් ඇතිවියහැකි බව පෙන්වා දියහැකිය. සියළු භාණ්ඩ වල වැරදි නිවැරදිභාවය පරීක්ෂා කර බලා බැංකුව විසින් භාණ්ඩ භාර ගැනීමෙන් අනතුරුව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම ද පසුව අවවාද කර සේවයේ පිහිටුවීමෙන් අනතුරුව ද නැවත එකී රත් භාණ්ඩ තොගයේම තෝරාගත් කොටසකට දෙවන වර චෝදනා කරමින් එකම චෝදනාව එකම භාණ්ඩ වල කොටස් සඳහා විවිධ අවස්ථාවල චෝදනා පත්‍ර ලබාදීම හා වැඩ තහනම් කිරීම තුළින් පැමිණිලිකරුට නීතියේ පිළිගත් මූලධර්ම හා න්‍යායන්හි සහතයන් නොලැබීමෙන් වෙනස්කොට සැලකීමක් සිදු වන බව ද නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර බැංකුවේ 2016/10 චක්‍රලේඛයේ වගන්ති අංක:11.:2 අනුව අරමුණු කර ඇත්තේ උගසට ගත් රත් භාණ්ඩ අතැති නිලධාරීන්ගෙන් වෙනත් නිලධාරියෙකු හෝ නිලධාරීන් අතට පත් වීමේදී නැති වීමක් හෝ පළුදු වීමක් සිදුවුවහොත් උගසට භාරගත් නිලධාරීන් වගකිවයුතු බවය. එකී පිළිගත් නීතිමය කරුණු පිළිබඳ මෙම පරීක්ෂණයේදී ලබාදී ඇති තාර්කික කරුණු එකී චක්‍රලේඛයේ අදහස උල්ලංඝනය වන බව නිරීක්ෂණය වේ. තවද නිවැරදි අර්ථ නිරූපණයන්හි පිහිටා කටයුතු නොකිරීමෙන් ද 'එකම චෝදනාව දෙවරක් පැවරීමෙන් වැළකී සිටීමේ අයිතිවාසිකම (RESJUDICATA)' පැමිණිලිකරුට අහිමිව ඇත්තේ වගඋත්තරකරුවන්ගේ විධායක හා පරිපාලන ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් බව නිරීක්ෂණය වේ.

විශේෂයෙන් වැඩ තහනමකට ලක්ව පැමිණිලිකරු වසර 06කට ආසන්න කාලයක් කටයුතු කර තිබීමෙන් පැමිණිලිකරු 'වෘත්තීය සමිතියක නායකයෙකු ලෙස කටයුතු කිරීම තමාට එරෙහිව ද්වේශ සහගතව කටයුතු කිරීමට හේතුවක් වී ඇති බවට' කරන ප්‍රකාශය තහවුරු කරන්නේද යන්න පිළිබඳව සාධාරණ

සැකයක් මතු වන්නේ, ආයතන සංග්‍රහය ප්‍රකාරව පිළිගත් ප්‍රකාශිත විනය පරීක්ෂණ, රීති සිද්ධාන්තයක් වන "එසරකට වඩා විනය පරීක්ෂණයක් ප්‍රමාද වන්නේ නම් සේවයේ පිහිටුවා එකී පරීක්ෂණ කටයුතු සිදු කළයුතු බවට" ඇති කරුණු ද බිඳවැටී ඇති බැවිනි.

මෙකී කරුණු අනුව, වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඉහත පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, හා පැමිණිලිකරුට දිගින් දිගටම සිදුවන මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා පහත පරිදි කටයුතු කිරීමට මින් නිර්දේශ කරමි.

01. පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කළ යුතු බවත්,

02. පැමිණිලිකරු සන්තකයේ පැවති රන් භාණ්ඩ භාරගන්නා අවස්ථාවේ එකී රන් භාණ්ඩ සම්බන්ධව වටිනාකම හෝ ප්‍රමාණය හෝ එහි තත්ත්වය පිළිබඳ අක්‍රමිකතාවයක් තිබෙන බව ප්‍රකාශ කර නොතිබේ නම්, පසුව වෙනත් නිලධාරීන් අතට රන් භාණ්ඩවල හිමිකම භාරගැනීමෙන් අනතුරුව පැමිණිලිකරුට චෝදනා කර තිබීම පිළිබඳ පවතින රන් භාණ්ඩ හා සම්බන්ධ චක්‍රලේඛීය ප්‍රතිපාදන සමග වෙනත් ඊට අදාලව සලකා බැලියහැකි චක්‍රලේඛමය නීතිරීති වෙත අවධානය යොමු කරමින් නිවැරදිව චෝදනාපත්‍රය නිකුත් කිරීමට, හෝ පැමිණිලිකරුට එරෙහිව ඔහු සන්තකයේ නොමැති හා ඔහු වෙතින් රන් භාණ්ඩ භාරගැනීමේදී අක්‍රමිකතාවයක් පිළිබඳ වගකීමක් භාරදී නොතිබුණේ නම් පසුව චෝදනා කරමින් කටයුතු කිරීම තුළ මානසික හිංසනයක් ඇතිවන ආකාරයට කටයුතු කර තිබීම තුළින් ඔහුගේ රැකියාව කිරීමට ඇති අයිතිය හා එහි සුරක්ෂිතභාවයට හානි කර තිබීම පිළිබඳව වගඋත්තරකාර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී වන සභාපති විසින් කරුණු පරීක්ෂා කර බලා කඩිනම් පියවර ගැනීමට කටයුතු කළ යුතු බවත්,

03. ඉහත අංක 02හි පරිදි කටයුතු කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ නිර්දෝෂීභාවය තහවුරු වන්නේ නම්, ඔහුට එරෙහිව අතීතිකව චෝදනා කර තිබීම සම්බන්ධව පියවර ගෙන සාධාරණ සහන හා හිමිවියයුතු උසස්වීම් ද අහිමි වූ වෙනත් වරප්‍රසාද ලබාදීමට කටයුතු කළයුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. ०२ . 10 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
B/Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. [illegible] Karunasiri
C[illegible]issioner
Human Rights Commission of Sri Lanka